සාමාන්‍ය සමය විසිහතරවන ඉරුදින **දේව ප්‍රකාශන** 16-09-12

## පළමුවන කියැවීම

ඉසයියස් 50:4-9

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"මට පහර දෙන්නන්ට මම මාගේ පිට පැවෙමි."**

විඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවෙකු මෙන් එතුමන්ට සවන් දෙනු පිණිස, මහෝත්තම දෙවි සමිඳාණෝ හැම උදයකම මා තුළ උනන්දුවක් ඇති කරවන සේක. දෙවි සමිඳුන් මාගේ කන් පහදා ඇත. මා එතුමන්ට විරුද්ධව කැරළි ගැසුවේ වත් එතුමන්ට පිටුපා ගියේවත් නැත. මට පහර දෙන්නන්ට මම මාගේ පිට පැවෙමි. මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ දුන්නෙමි. මාගේ මුහුණ නින්දාවෙනුත් කෙළ ගැසීමෙනුත් හරවා නොගතිමි. මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් මම වියවුල් නොවන්නෙමි. මම නිර්භීත ලෙස මුහුණ පාන්නෙමි. මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි. මන්ද දෙවිඳාණෝ මා ළඟය. එතුමාණෝ මා නිදොස් බව පෙන්වන සේක. මට විරුද්ධව චෝදනා කරන්නේ කවරෙක් ද? අපි දෙදෙනාම විනිශ්චයට යමු. ඔහු මට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරත්වා! මහෝත්තම දෙවි සමිඳාණෝ මට උපකාර කරන සේක. 'මා වැරදිකරු ය'යි ඔප්පු කළ හැක්කේ කවරකුට ද?

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 116:1-6, 8-9

පිළිතුර: මම සමිඳුන් ඉදිරියෙහි හැසිරෙන්නෙමි.

ගීය: සමිඳුන්ට ප්‍රේම කරමි. මන්ද, එතුමාණෝ මාගේ අයැදුම් ද මාගේ කන්නලව්ව ද ඇසූ සේක. එතුමාණන් මා දෙසට කන් යොමු කළ බැවින් දිවි ඇති තාක් මම එතුමන්ට යාච්ඤා කරන්නෙමි.

මාරක රැහැනෙන් මම වෙළුනෙමි. පාතාලයේ වේදනා මා අසු කරගත්තේ ය. විපත හා දුක මා වෙලා ගත්තේ ය. එවිට මම සමිඳුන්ගේ නාමයෙන් අයැදිමි. 'සමිඳුනි, මා මිදුව මැනවැ'යි කීමි. සමිඳාණෝ දයාවන්ත ය, දැහැමි ය, එසේ ය. අපේ දෙවිඳාණෝ අනුකම්පාවෙන් යුක්ත ය.

සමිඳාණෝ නිහතමානී අය සුරකින සේක. මා අනතුරේ වැටී සිටිය දී එතුමාණෝ මා ගළවාගත් සේක. එතුමාණෝ මාගේ ජීවිතය මරණයෙන් ද මාගේ ඇස් කඳුලෙන් ද මාගේ පාද පැකිළීමෙන් ද ගළවාගත් සේක. එසේ හෙයින් මම ජීවතුන් අතර සමිඳුන් ඉදිරියෙහි හැසිරෙන්නෙමි.

## දෙවන කියැවීම

ජාකොබ් 2:14-18

ශුද්ධ වූ ජාකොබ් තුමාගේ හසුනෙන් ගත් කොටසකි.

**"ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි."**

මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැ යි යමකු කීවත් ක්‍රියා වලින් එය ප්‍රකාශ නොවේ නම් ඉන් වැඩක් ඇද්ද? එවැනි ඇදහිල්ලක් ඔහුට ගැළවීම ගෙන දෙයි ද? යම් සහෝදරයෙකු හෝ සහෝදරියක හෝ ඇඳුම් නැතිව, දිනපතා කෑම නැතිව සිටිය

දී, ඔබගෙන් යමෙක් ඔවුන්ගේ ශාරීරික අවශ්‍යතා සපයා නොදී, "ඔබට දෙවි පිහිටයි! උණුසුමට ඇඳ පැළඳ, කා බී සතුටු වන්න"යි ඔවුන්ට කියන්නේ නම් එයින් මොන යහපතක් ද? ඇදහිල්ල ගැන කිය යුත්තේ එය ම යි. ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි. "ඔබට ඇත්තේ ඇදහිල්ල ය. මට ඇත්තේ යහපත් ක්‍රියා ය. හොඳයි ඔබ ක්‍රියා නැතිව ඔබේ ඇදහිල්ල පෙන්වන්න. මම මාගේ ක්‍රියා වලින් මාගේ ඇදහිල්ල පෙන්වමි"යි කියන්නට යමකුට පුළුවන්කම තිබෙනවා විය හැකි ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 14:6

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය"යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මාක් 8:27-35

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**" මනුෂ්‍ය පුත්‍රයාණෝ දුක් වේදනා විඳින්නට ද, මරණයට පත්වන්නට ද නැවත උත්ථාන කරනු ලබන්නට ද නියමය."**

ජේසුස් වහන්සේ ද ශ්‍රාවකයෝ ද පිලිප්පි කායිසාරියේ ගම්වලට නික්ම ගියහ. මඟ දී උන් වහන්සේ, කතා කරමින්, "මා කවරෙකු කියා මිනිස්සු කියත් දැ"යි ශ්‍රාවකයන්ගෙන් ඇසූ සේක. ඔව්හු උත්තර දෙමින්, "සමහරෙක්, 'ස්නාවක ජුවාම් ය'යි කියති. සමහරෙක්, 'එලියා ය'යි කියති; අන් සමහරෙක්, 'දිවැසිවරයන්ගෙන් කෙනෙකැ'යි කියති"යි පැවසූ හ. "මා කවරෙකු කියා ඔබ කියන්නහු දැ"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය"යි පේදුරු පිළිතුරු දුන්නේ ය. උන් වහන්සේ ද තමන් ගැන කිසිවෙකුට නොකියන ලෙස ඔවුන්ට අණ කළ සේක. එවිට උන් වහන්සේ මනුෂ්‍ය - පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන් ද නායක පූජකයන් ද විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නනටත් මරනු ලබන්නටත්, තෙ දිනකට පසු නැවත නැගිටින්නටත් නියම බව ඔවුන්ට උගන්වන්න පටන්ගත් සේක. උන් වහන්සේ මේ ගැන ප්‍රසිද්ධියේ ම කතා කළ සේක. එකල පේදුරු උන් වහන්සේ පසෙකට ගෙන, උන් වහන්සේට තදින් චෝදනා කෙළේ ය. උන් වහන්සේට හැරී, සිය ශ්‍රාවකයන් දෙස බලා, පේදුරුට තදින් චෝදනා කරමින්, "සාතන්, අහකට යව, නුඹ සිතන්නේ, මිනිසුන් සිතන විධියට මිස දෙවියන් වහන්සේ සිතන විධියට නොවේ ය"යි වදාළ සේක. එවිට උන් වහන්සේ සිය ශ්‍රාවකයන් කැටුව සමූහයා තමන් වෙත කැඳවා ඔවුන් අමතා මෙසේ වදාළ සේක: "යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරා, මා අනුව ඒවා! සිය ජීවිතය රැකගන්න තැත් කරන යමෙක් වේ ද ඔහු එය නැති කරගනියි. මා උදෙසාත්, සුබ අස්න උදෙසාත් සිය ජීවිතය පුදන යමෙක් වේ ද, ඔහු එය රැකගනියි."

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.